යම්කිසි වෘත්තියක් හැඳින්වීමේදී, අපහාසාත්මක ස්වරයකින් දැක්වෙන නිශේධනාත්මක නාමකරණයන් ඇතැම් විට මාධ්‍ය තුළ දක්නට ලැබේ. "ගුරුවරයා" වෙනුවට "ගුරා" ලෙසින් වැහැරීම ඊට එක් උදාහරණයකි.
එසේම මෙම පුවත් වාර්තාවේ සඳහන් ගුරු වෘත්තිකයා සැකකරුවකු හෝ වරදකරුවකු වීම, එම වෘත්තිය ආශ්‍රය කරගත් නිශේධනාත්මක නාමකරණයක් භාවිතා කිරීමට හේතුවක් විය යුතු නොවේ.

ජනමාධ්‍ය තුළ නිශේධනාත්මක නාමකරණයක් භාවිතා වීමේ ගැටලුව අපි නැවත නැවතත් සාකච්ඡාවට ගෙන ඇත්තෙමු. ශිෂ්ට සම්පන්න චින්තනයක් උදෙසා භාෂාවේ ඇති බලපෑම නොසලකා හැරිය නොහැක. ඒ නිසාම ඉහත ආකාරයේ නිශේධනාත්මක නාමකරණයන් මාධ්‍ය තුළ භාවිතා කිරීම මඟ හැරිය යුතු නොවේදැයි අපි අසමු.

#MediaEthicsSL #lka #SinhalaPress #News #Divaina